# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1939/26 - 2015 නොවැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2015.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

49 ''ඒ'' වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තිය සමග කියැවෙන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 49 ''ඒ'' වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන ම විසින් 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සඳහා, මෙහි උප ලේඛනයේ නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති ඉඩම අවශ්‍ය බව මෙම නියෝගයෙන් ප්‍රකාශ කර සිටිමි.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2015 නොවැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු යටිකහ කෝරලේ, කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බලයලත් මිනින්දෝරු, ඇනස්ලි වී ලියනගේ මහතා විසින් 2015.09.09 දින මැන පිළියෙල කරන ලද අංක 3595 සැලැස්මේ කැබලි අංක ඒ, බී, සී 1 සහ ඩී 1 දක්වා පෙන්නුම් කරන, ප්‍රමාණයෙන් හෙක්. 12.053 (අක්. 29. රූඩ් 02. පර්. 5.39)ක් වූ ඉඩම් කොටස් සඳහා මායිම් පහත පරිදි වේ :

**01. කැබලි අංක ''ඒ'' :**

| | | |
|---|---|---|
| උතුරට | : | තුම්මෝදර, ගලකුඹුර පාර ; |
| නැගෙනහිරට | : | තුම්මෝදර, බෝහින්ගමුව පාර සහ ගම්වාසීන්ට අයත් කුඹුරු ඉඩමෙහි කොටසක් ; |
| දකුණට | : | කැබලි අංක ''බී'' සහ කුඹුරු ඉඩමෙහි කොටසක් ; |
| බටහිරට | : | තුම්මෝදර, ගලකුඹුර පාර සහ ඇලෙහි කොටසක්. |

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 3.6896 (අක්. 09 රූඩ්. 0 පර්. 18.75)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**02. කැබලි අංක ''බී'' :**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක ''ඒ'' ; |
| නැගෙනහිරට | : | කැබලි අංක ''ඒ'' හි කොටසක් සහ කුඹුරු ඉඩම ; |
| දකුණට | : | ඇල ; |
| බටහිරට | : | ඇල. |

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.9832 (අක්. 02 රූඩ්. 1 පර්. 28.73)

**03. කැබලි අංක ''සී 1'' :**

| | | |
|---|---|---|
| උතුරට | : | ගම්වාසීන්ට අයත් ඉඩම් ; |
| නැගෙනහිරට | : | ඇලෙහි කොටසක්, ඩී 2 හි කොටසක්, සී 2 සහ ඩී 1 ; |
| දකුණට | : | කුලියාපිටිය - කුරුණෑගල ප්‍රධාන මාර්ගය සහ කැබලි අංක සී 2 හි කොටසක් ; |
| බටහිරට | : | බලයලත් මිනින්දෝරු, ඇනස්ලි වී ලියනගේ මහතා විසින් මැන පිළියෙල කරන ලද පිඹුරු පත් අංක 3364 හි කැබලි අංක 1. |

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 7.0038 (අක්. 17 රූඩ්. 0 පර්. 9.09)

**04. කැබලි අංක ''ඩී 1'' :**

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක සී 1 හි කොටසක් ; |
| නැගෙනහිරට | : | කැබලි අංක සී 1 හි කොටසක් සහ ඇලෙහි කොටසක් සහ කැබලි අංක ඩී 2 හි කොටසක් ; |
| දකුණට | : | කැබලි අංක ඩී 2 හි කොටසක් ; |
| බටහිරට | : | කැබලි අංක සී 1. |

ඉඩමේ ප්‍රමාණය : හෙක්ටයාර් 0.3764 (අක්. 0 රූඩ්. 3 පර්. 28.82)

11 - 519

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.